# දූෂණ සහ අවකල්ක්‍රියා ගැන වාර්තා කිරීම

www.ibac.vic.gov.au

ඔබ දූෂණය දුටුවාද? යමක් ගැන සැකද? ඔබේ තොරතුරු මගින් රාජ්‍ය අංශයේ දූෂණ සහ පොලිස් අවකල්ක්‍රියා නිසා මහජන මුදල් නාස්තිවන අන්දම සහ වික්ටෝරියානුවන්ට හානි ගෙනදෙන අන්දම එළිදරව් කළ හැකිය. වැදගත් කරුණක් නම්, ඔබේ පැමිණිල්ලෙන් අනාගතයේ දූෂණ සහ අවකල්ක්‍රියා වැළැක්වීම සඳහා සෑමදෙ දනාටම වටිනා පාඩම් ඉගෙන ගැනීමට හැකියාව තිබෙන බවයි.

## IBAC වෙත වාර්තා කළ හැක්කේ මොනවාද?

### 1 රාජ්‍ය අංශයේ ආයතනයක හෝ සේවකයකු ගේ දූෂණ

දූෂණය යනු පුද්ගලයෙක් විසින්, වංචා සිදු කිරීම, අල්ලස් ලබා ගැනීම හෝ දීම, පවුල් අයට හෝ මිතුරන්ට කොන්තරාත්තු පිරිනැමීම, සහ පුද්ගලික වාසි සඳහා වරප්‍රසාද යටතේ ලබාගත් තොරතුරු පිට කිරීම හෝ පාවිච්චි කිරීම විය හැකිය.

පහත දේ ගැන IBAC වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට පුළුවන:

- ප්‍රාන්ත රජයේ සේවකයෝ (දෙපාර්තමේන්තු, ආයතන, රජයේ රෝහල්, රජයේ පාසල් , විශ්ව විද්‍යාල සහ TAFEs)
- වික්ටෝරියානු පොලිස් නිලධාරීන්, සේවයට අළුතෙන් බඳවා ගත් අය, ආරක්ෂක සේවා නිලධාරීන් (Protective services officers (PSOs)), පොලිස් අත්අඩංගු නිලධාරීන් සහ සේවකයන්
- කවුන්සල කාර්ය මණ්ඩල සහ කවුන්සල සභිකයෝ
- පාර්ලිමේන්තු මන්ත්‍රී වරු සහ ඔවුන්ගේ සේවකයෝ
- විනිශ්චයකරුවෝ, මහේස්ත්‍රාත් වරු සහ වෙනත් අධිකරණ සාමාජිකයන්

ඔබේ කාරණය, අදාල ආයතනයේ පොදු යහපත සම්බන්ධ කරුණු අනාවරණ සම්බන්ධීකාරක (Public Interest Disclosure Coordinator) හරහා කෙලින්ම අදාල ආයතනයට ඉදිරිපත් කිරීමටද ඔබට පුළුවන. කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ප්‍රජාවේ සාමාජිකයන්ට පැමිණිලි ඉදිරිපත් කිරීමට සහාය වීම පිණිසත්, සිවුරුහන්ලන්න (whistleblowers) ආරක්ෂා කරනු පිණිසත් බොහොමයක් රාජ්‍ය අංශ ආයතන වල මේ කරුණු සම්බන්ධව කටයුතු කරන නිලධාරියෙක් සිටී.

හෙළිදරව් කිරීම් ලබා ගැනීම සඳහා බලයලත් නියෝජිත ආයතනවල ලැයිස්තුවක් ඔබට www.ibac.vic.gov.au/PID හිදී ලබා ගත හැකිය

### 2 රජයේ තනතුරු වල අවකල්ක්රියා

රජයේ තනතුරු වල අවකල්ක්‍රියා පුළුල්ව නිර්වචනය කෙරේ. රජයේ සේවකයකුගේ නීති විරෝධී හෝ රාජකාරි කටයුතු වලදී හෝ තමන්ට පැවරී ඇති බලතල පාවිච්චි කිරීමේදී පිළිපැදිය යුතු ආචාරධර්මීය හෝ වෘත්තීය සම්මතයන් ආරක්ෂා නොවන ආකාරයේ ඕනෑම ක්‍රියාවක් රජයේ තනතුරු වල අවකල්ක්‍රියාවක් විය හැකිය.

### 3 වික්ටෝරියා පොලිස් අවකල්ක්‍රියාව

දිවුරුම් ලත් නිලධාරීන්, සේවයට අළුතෙන් බඳාවා ගත් අය, සේවකයන් සහ PSOs ඇතුලු සියලුම වික්ටෝරියානු පොලිස් සේවක මඩුල්ලේ අය ගැන අවකල්ක්‍රියා ගැන පැමිණිලිද IBAC විසින් ලබා ගනු ලැබේ. අවකල්ක්‍රියාව යනු පොලිස් සේවකයෙකු විසින් අහිතකර කරුණු බෙදා හැරීම, වෙරි මතින් රිය පැදවීම, ලොග් පොතක /නාමලේඛනයක අසත්‍ය තොරතුරු ඇතුලත් කිරීම හෝ අධික බලය පාවිච්චි කිරීම විය හැකිය.

පොලිස් අවකල්ක්‍රියා පිළිබඳ පැමිණිලි වික්ටෝරියානු පොලිස් වෘත්තීය ප්‍රමිති විධානයටද (Victoria Police's Professional Standards Command) පහත අංකය යටතේ ඉදිරිපත් කළ හැකිය 1300 363 101.

### IBAC ට විභාග කල නොහැකි දේවල්

- පෞද්ගලික අංශය.
- වෙනත් ප්‍රාන්ත හෝ රාෂ්ට්‍ර වල හටගත් ප්‍රශ්න.
- ෆෙඩරල් ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, දෙපාර්තමේන්තු හෝ ආයතන.

ibac independent broad-based anti-corruption commission Victoria

## ඔබව ආරක්‍ෂා කරණු ලැබෙ

ඔබේ පැමිණිල්ල සහ පුද්ගලික තොරතුරු IBAC විසින් ප්‍රවේසමෙන් සහ රහසිගතව භාවිතා කරනු ලැබේ. ඔබගේ පැමිණිල්ල පොදු යහපත සම්බන්ධ කරුණු අනාවරණයක් ලෙස සලකයි නම්:

- ඔබගේ නම සහ පුද්ගලික තොරතුරු වෙන කිසිවෙකු හට ලබා දෙන්නේ නැත (ඔබගේ පැමිණිල්ල යොමු කරන ආයතන හැර)
- ඔබ පැමිණිල්ලක් ඉදිරිපත් කළ හේතුව නිසා ඔබව නෙරපා හැරීමට, විනයානුකූලව කටයුතු කිරීමට හෝ හිරිහැර වලට ලක් කිරීමට නුපුළුවන
- ඔබව අපහාස නඩු හෝ සිවිල් වගකීම වැනි නඩු පැවරීමෙන්ද ආරක්ෂිතය
- ඔබේ මිතුරන්, පවුලේ උදවිය හෝ සහායකයන්ද ආරක්ෂිතය.

ඔබගේ පැමිණිල්ල පොදු යහපත සම්බන්ධ කරුණු අනාවරණයක් නොවේ නම්, ඔබගේ අනන්‍යතාවය රහසිගතව තබාගත යුතු නැති වුවද:

- ඔබ පැමිණිල්ලක් ඉදිරිපත් කළ හේතුව නිසා ඔබව නෙරපා හැරීමට, විනයානුකූලව කටයුතු කිරීමට හෝ හිරිහැර වලට ලක් කිරීමට නුපුළුවන
- ඔබව අපහාස නඩු හෝ සිවිල් වගකීම වැනි නඩු පැවරීමෙන්ද ආරක්ෂිතය.

ඔබගේ පුද්ගලිකතාව සම්බන්ධයෙන් දැඩි කනස්සල්ලක් ඇති නම්, ඔබට නිර්නාමිකව පැමිණිල්ල යොමු කල හැකිය. ඔබ නිර්නාමිකව පැමිණිල්ලක් යොමු කලහොත්, අපගේ විමර්ශන සීමාසහිත වනු ඇත. මෙයට හේතුව වැඩිදුර විස්තර සඳහා අපට ඔබ හා සම්බන්ධ වීම නොකල හැකිවීම, හෝ ඔබ පසු විපරම් කලහොත්, ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කල නොහැකි වීමයි.

### පොදු යහපත සම්බන්ධ කරුණුඅනාවරණයක් යනු කුමක්ද?

රජයේ නිලධාරියෙකු හෝ රජයේ ආයතනයක නොමනා හැසිරීම ඇතුලත් අනාවරණයක් (උදාහරණ වශයෙන් දූෂණය), හෝ අගතිගාමී ක්‍රියාවක් (උදාහරණ වශයෙන් අනාවරණයක් කල අයෙකුව සේවයෙන් පහ කිරීම).

## ඔබ විසින් දූෂණ සහ අවකල් ක්‍රියා සම්බන්ධයෙන් IBAC වෙත වාර්තා කල විට කුමක් සිදුවේද?

ඔබ විසින් වාර්තා කල දෙය පොදු යහපත සම්බන්ධ කරුණු අනාවරණයක්ද යන්න IBAC මගින් නීර්ණය කරණු ඇත.

ඔව්, එය පොදු යහපත සම්බන්ධ කරුණු අනාවරණයක්වේ.

**විමර්ශනය**

IBAC මගින් පැමිණිල්ල විමර්ශනය කල හැකිය.

**යොමු කිරීම**

IBAC මගින් පැමිණිල්ල පහත ආයතනයක් වෙත විමර්ශනය සඳහා යොමු කල හැකිය:

වික්ටෝරියානු ඔම්බඩ්ස්මන්වරයා, වික්ටෝරියා පොලීසිය (පොලීසියට අදාල කටයුත්තක් නම්), ප්‍රධාන නගර සභා පරීක්ෂක, තොරතුරු කොමසාරිස්වරයා, තුරග තරඟ අවංකභාවය සම්බන්ධ කොමසාරිස්වරයා, අධිකරණ කොමිසම.

පැමිණිල්ල කල අයගේ කැමැත්ත ඇතිව, අදාල පැමිණිල්ල සම්බන්ධයෙන් කටයුතු කිරීමට වෙනත් ආයතනයකට යොමු කල හැක.

**වැඩිදුර කටයුතු සිදු නොකරයි**

කාරණා කිහිපයක් හේතුවෙන් පැමිණිල්ල ඉවත ලෑමට අප විසින් කටයුතු කල හැකිය, උදාහරණ වශයෙන්:

- හරයක් හෝ විශ්වසනීයත්වයක් නැති බව
- ප්‍රකෝපකාරී හෝ ඉතා සුළුවීම
- IBAC මගින් හෝ *2011 IBAC* පනත මගින් නිර්ණය කරන ලද ආයතනයකින් විමර්ශනය කල නොහැකි කරුණක් සම්බන්ධයෙන්.

නැත, එය පොදු යහපත සම්බන්ධ කරුණු අනාවරණයක් නොවේ.

**යොමු කිරීම**

අනාවරණය IBAC මගින් වෙනත් ආයාතනයකට (උදා. වික්ටෝරියානු ඔම්බඩ්ස්මන්වරයා) හෝ පැමිණිල්ලේ සඳහන් කල ආයතනය වෙත යොමු කල හැකිය.

පොලිස් අවකල් ක්‍රියා සම්බන්ධ අනාවරණ ප්‍රධාන පොලිස් කොමසාරිස්වරයා වත යොමු කල හැකිය.

**වැඩිදුර කටයුතු සිදු නොකරයි**

IBAC මගින් වැඩිදුර කටයුතු සිදු නොකරයි.

## පැමිණිලි කරන්නේ කෙසේද?

ආරක්ෂිත මාර්ගගත පෝරමය මෙතනින් පුරවන්න www.ibac.vic.gov.au මාර් ගගත පෝරමය ලබා ගැනීමට ඔබට අපහසු නම්, කරුණාකර පහත අංකය ඔස්සේ අප අමතන්න 1300 735 135.

ඔබට පරිවර්තන උපකාර අවශ්‍යනම් මේ අංකය ඔස්සේ පරිවර්තන සහ භාෂණ පරිවර් තන සේවය අමතන්න 13 14 50 නැතහොත් මේ වෙබ් අඩවියට පිවිසෙන්න www.ibac.vic.gov.au/mylanguage

### ඔබ IBAC ඇමතීමට කලින්

අපට බාරගැනීමට හැකි සහ බාරගැනීමට නොහැකි පැමිණිලි මොනවාද යන්න ගැන කරුණාකර දැනුවත් වන්න. ඔබේ පැමිණිල්ල දූෂිත ක්‍රියා හෝ අවකල්ක්‍රියා ගැන නොවේ නම්, අප ඔබව වික්ටෝරියානු ඔම්බඩ්ස්මන් (Victorian Ombudsman) වැනි වෙනත් ආයතනයකට යොමු කරනු ලැබේ.

ඔබේ පැමිණිල්ල කවුරු ගැනද/කුමක් ගැනද යන්න පැහැදිලිව දක්වන අතරම හැකි තරම් විස්තර සහ සාක්කිද ඉදිරිපත් කරන්න.

## IBAC ඔබේ තොරතුරු වලට කරන්නේ කුමක්ද?

බරපතල සහ ව්‍යුහාත්මක දූෂණ සහ අවකල්ක්‍රියා පිළිබඳ චෝදනා සඳහා ප්‍රමුඛත්වය දීමට IBAC නීතියෙන් බැඳී සිටී. ඔබේ පැමිණිල්ල ප්‍රවේසමෙන් ඇගයුම් කිරීමෙන් පසු IBAC විසින් පහත තීරණ ගනු ඇත:

- පැමිණිල්ල යොමු කිරීමට
- විභාග කිරීමට
- වැඩිදුර ක්‍රියා මාර්ගයක් නොගැනීමට.

අපට හරි කරුණු සඳහා ප්‍රමුඛත්වය තීරණය ගැනීම සඳහා ඔබේ පැමිණිල්ල ගැන අප කල යුත්තේ කුමක්දැයි නිශ්චය කර ගැනුමට IBAC විසින් මූලික විමසීමක් පැවැත්වීමට ඉඩ තිබේ.

මූලික විමසුමකදී අපට අපේ පුළුල් විමර්ශන බලතල වැඩිහරියක් පාවිච්චි කළ ෙ නොහැකි වුවද, පහත දේ අප විසින් කිරීමට ඉඩ ඇත:

- ඕනෑම කෙනෙකුගෙන් වැඩිදුර තොරතුරු ඉල්ලා සිටීම
- ලියවිලි ඉදිරිපත් කරන ලෙස පුද්ගලයකුට සිතාසි නිකුත් කිරීම
- රහසිගතභාවය පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම.

## ඔබේ තොරතුරු උපකාරී වේ

ඔබේ පැමිණිල්ලේ ප්‍රතිඵලය කුමක් වුවද, ඔබ අපට සපයන තොරතුරු පුළුල් ප්‍රවනතා සහ රටාවන් හඳුනා ගැනීමට අපට උපකාරී වේ. වඩා තම ක්‍රියාවලි සහ ආයතන වල අනතුරට භාජනය වීමේ ඉඩකඩ තිබෙන අවස්ථා ගැන රාජ්‍ය අංශයට අනතුරු ඇඟවීමට IBAC මෙම විශ්ලේෂණ භාවිතා කරනු ලැබේ.


Level 1, North Tower
459 Collins Street,
Melbourne VIC 3000
GPO Box 24234,
Melbourne, VIC 3001

දුරකථන 1300 735 135
ෆැක්ස් (03) 8635 6444


ජනවාරි 2020

IBAC රාජ්‍ය අංශයේ දූෂිත ක්‍රියා සහ පොලිසියේ අවකල්ක්‍රියා වැලැක්වීමේ සහ එළිදරව් කිරීමේ වගකීම පැවරුණ වික්ටෝරියාවේ දූෂණ විරෝධී ආයතනයයි. අප මෙම කාර්යය කරන්නේ පහත ආකාරයටය:

- බරපතල දූෂිත ක්‍රියා සහ පොලීසියේ අවකල්ක්‍රියා විභාග කිරීම
- දූෂිත ක්‍රියා සහ පොලිසියේ අවකල්ක්‍රියා වල අවදානම් සහ ප්‍රතිඵල ගැන සහ ඒවා වළක්වා ගැනීමට ඇති මාර්ග ගැන රාජ්‍ය අංශය, පොලිසිය සහ ප්‍රජාවට දැනුම් දීම

දූෂණය සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා දැන් **www.ibac.vic.gov.au** වෙබ් අඩවිය වෙත යන්න, නැතිනම් දුරකථන අංක **1300 735 135** අමතන්න.

ඔබට පරිවර් තන උපකාර අවශ්‍යනම් මේ අංකය ඔස්සේ පරිවර් තන සහ භාෂණ පරිවර් තන සේවය අමතන්න **13 14 50** හෝ මේ අඩවියට පිවිසෙන්න **www.ibac.vic.gov.au/mylanguage**